ජගත් ජේ එදිරිසිංහ ලියන

# තාරකා විජිතය



12

''ඔයා සතුටකින් ඉන්නවා වගේ පෙනුණ ට සතුටකින් නෙවෙයි නේද ඉන්නෙ....?'' මනීෂා ඇසුවා ය. ඇය වාඩි වී සිටියේ සිනමා හළේ අනුරාධට යාබද අසුනේ ය. මේ සිනමා පටයේ ඇගේ රංගනය ප්‍රශස්ත මට්ටමක ඇතැයි අනුරාධ ඒ මොහොතේ සිතමින් සිටියේ ය. තමා සමඟ ඈ රඟපෑ සිනමාපට අතරින් ඇගේ හොඳම රංගනය ඇත්තේ මෙහි යයි ඔහු තක්සේරු කර තිබුණි. චිත්‍රපටය ආරම්භ කරන්නට පෙර ප්‍රේක්ෂකයන් ඉදිරියේදී පැවැත්වූ කතාවේදී ද ඔහු ඒ බව විශේෂයෙන් සඳහන් කළේ ය.

''ඔයා මේ රෝල් එක හොඳට කරලා තියෙනවා.. මම ෂූට් එකේදිම තේරුම් ගත්තා මේක ඔයා හොඳට කරන බව..'' ඇගේ ප්‍රශ්නය නෑසුණා සේ ඔහු කීවේ ය.

''කෙහෙල්මල ...'' මනීෂා සිට නොසතුට ඇඟෙව්වා ය. ''.. අනුරාධ අයියා.. ප්‍රශ්නයක් ඇහුවාම ඒකට උත්තර දෙන්න..''

''මොකක්ද ඇහුවෙ..?''

''ඇයි හිත හංග ගෙන ඉන්නේ.. හිනාවක් මූණෙ ඇඳ ගත්තට මට දැනෙනවා හිතේ සතුටකින් නෙවෙයි ඉන්නෙ කියලා..''

අනුරාධ පිළිතුරක් නොදී තිරය දෙස බලා සිටියේ ය. මේ සිනමා පටයේ තමාගේ රංගනයේ යම් දුර්වල කමක් ඇතැයි ඔහුට සිතුණි. ප්‍රබල ලෙස හැඟීම් මතු කළ හැකිව තිබූ අවස්ථා ගණනාවක් ම තමා මඟ හැර ඇතැයි ඔහුට සිතෙයි.

''ඇයි කල්පනා කරන්නෙ..?'' මනීෂා ඔහුගේ අතින් අල්ලා ගත්තා ය. ඔහු සීරුවෙන් ඇගේ අතින් තම අත මුදා ගත්තේ ය.

''ප්‍රශ්න නැති කෙනෙක් කොහෙද ඉන්නෙ මනීෂා..'' ඔහු කීවේ යමක් කිව යුතුම වූ නිසා ය.

''හරිම සම්ප්‍රදායික උත්තරයක්..'' ඇය ඔලොක්කුවෙන් සිනාසුණා ය. ''.. අර ඇක්සිඩන්ට් එකේදි ළඟින් හිටිය ගෑනු ළමයා ගැන නේද ඔය හැම තිස්සෙම හිතන්නෙ..?''

''ඔව්...'' ඔහු එකවරම කීවේ ය.

'ෂත්.. හරිම වීරයා වෙලානෙ මෙයා.. දෙපාරක් නොහිතා කෙළින්ම කිව්වා නේද..? නියමයි අයියා..''

ඔහු නිහඬව තිරය දෙස බලා සිටියේ ය.

''එක අතකින් ඔයා නොකිව්වත් මුලු ෆීල්ඩ් එකේම අය ඔය කතාව දැන් දන්නවා.. ''

''මං ඒක හංගන්න උත්සාහ කරලා නැහැ කිසිම වෙලාවක..''

''හංගන්නෙ කොහොමද..? කාර් එක හැප්පුනේ ඔක්කොම පත්තරේම වැටෙන විදිහටනෙ..'' මනීෂා සිනාසුණා ය. ''ඒත් ඉතින් පුදුමෙ මේ තරම් කාලයක් තාපසයෙක් වගේ හිටපු ඔයාට මේ වෙච්ච දේ තමයි..''

තිරය මත අපූරු පෙම් ගීයක් දිස් වෙයි. එ දෙස මොහොතක් බලා සිටි මනීෂා නැවත ඔහු දෙස බැලුවේ ය. ඔහුගේ නිවුණු දෑස අඩ අඳුරේ වුව ද ඇයට පෙනෙයි.

''මට වෙලාවකට ඔයා ගැන පුදුම හිතෙනවා අනුරාධ.. මං ඔයාගෙ පස්සෙන් ආව විදිහට මේ ෆීල්ඩ් එකේ වෙන මනුසයෙක් පස්සෙ ගියා නම් මට මේ වෙන කොට මොනා වෙලාද කියලා හිතා ගන්නවත් බැහැ.. ඒත් ඔයා අයිස් කැටයක් වගේ සීතල මිනිහෙක්.. ඒ ඇයි කියලා මට හිතා ගන්නවත් බැහැ.. මනුස්සයෙකුට එහෙම වෙන්න පුලුවන්ද කියලා මං හැම තිස්සෙම හිතනවා.. ඒක හරිම අසාමාන්‍ය යි..'' මනීෂා මිමිණුවා ය.

අසාමාන්‍ය බවම සාමාන්‍යය වී තිබූ ජීවිතයක් වෙනස් වූ අරුමය කෙසේ නම් අදහා ගන්නද? ජීවිතයේ බොහෝ දුක් වේදනා විසින් දමනය කර දමනු ලැබ තිබූ තම සිත නිෂාදි විසින් එක දිනක දී නිදහස් කරන ලද ආකාරය ඇදහිය හැක්කේ කෙසේ ද? ඒ සංසාරගත බැඳීමක සැළමුතු බලවේගය ද?

''කල්පනා කරන්න එපා.. ඔයා හොඳ මනුස්සයෙක්.. අපි ඒක දන්නවා.. හැමදේම හොඳින් සිද්ද වෙයි..'' ඇගේ සිහින් හඬ ඔහුට ඇසුණි.

*කවිකාර සිත් අහසෙ දේදුන්න පායලා*
*සංසාරගත පෙමක් තෙළිතුඩක තවරලා*
*ලංකාර මග දෙපස සොඳුරු සිතුවම් මවා*
*හරසාර දිවි මගක සිහිනයන් එළි කලා*

නිම්නාද දෙන සරැළි සත්සරට මුසු වෙලා
වෙල් යාය දුව පැන්න නිලන.... යුරු බල බලා
ඉගිලෙනා සමනළුන් මල් පාර පෙන්වනා
කුමරියේ දැනෙනවද හද ගැහෙන ගායනා

''ඔව් .. හැම දේම හොඳින් සිදුවේවි..'' ඔහු සිතුවේ ය.

ඒ රාත්‍රිය අනුරාධ ට බොහෝ දිග එකක් විය. නිෂාධිට දුරකතන ඇමතුමක් දෙන්නට කීප වතාවක් ඔහු උත්සාහ කළ නමුත් මොන යම් හෝ හේතුවක් නිසා ඇය සම්බන්ධ කර ගන්නට ඔහුට නොහැකි විය.



නිෂාධි අමතා අද සවස මංගල දර්ශනය පිළිබඳ ඇය හා දොඩන්නට ඔහු පුල පුලා බලා සිටියේ ය. ''මල් වැස්ස'' සාර්ථක ලෙස ප්‍රදර්ශනය වන සිනමා පටයක් වන බවට සැකයක් නැත. තමා සෑහීමකට පත් නොවුණ ද එය තමා රඟ පෑ හොඳම සිනමා පටයක් යයි එහි පූර්ව දර්ශන නැරඹූ සිනමා විචාරකයන් මේ වන විටත් ලියා ඇත. මේ සියලු සතුට ඇය හා බෙදා ගන්නට ඔහුට අවශ්‍යව තිබුණි.

දින කීපයකට පෙර ඔස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලයෙන් ලබා ගෙන ආ සංචාරක වීසා අයැදුම් පත තවමත් මේසය මත ඇත. එය පුරවන්නට පටන් ගත් නමුත් අතර මඟ නවතා දැමුවේ සුනෙත් නිසා ය.

''ඕක දාන්න එපා.. හරියාකාර හේතුවක් පෙන්නන්න විදිහක් නැතිව නිකම් වීසා ඇප්ලයි කරලා රිජෙක්ට් වුණාම ආයෙත් ගන්න අමාරුයි.. මතකද විරංජනට වෙච්ච වැඩේ.. මුලින්ම මිනිහගෙ වීසා ඇප්ලිකේෂන් එක රිජෙක්ට් වුණා.. දෙවෙනි පාර වීසා ගන්න ගියාම ඒක ලොකු ප්‍රශ්නයක් වුණා...''සුනෙත් කීවේ අනුරාධ අයැදුම් පත පිරවීම පිළිබඳ ඔහුගෙන් විමසා සිටි අවස්ථාවේ දී ය. ''කලබල නොවී පොඩ්ඩක් ඉවසපන්.. කරන දේ හරියටම එක පාරටම කරමු.''

ජීවිතය හදිසියේ අතරමඟක නතරව ඇති සෙයක් අනුරාධට දැනෙයි. මෙතැනින් ඉදිරියට යන්නේ කෙසේදැයි සිතා ගත නොහැකි බවක් ඔහුට දැනුණි. තමාට ඇවැසි ලෙස කිසිවක් කළ නොහැකි ය. සියල්ල සිදු වන්නේ දරා සිටින්නට නොහැකි තරම් මඳ වේගයකින් යයි ඔහුට සිතුණි. එය ඉක්මන් කරවන්නට හැකියාවක් තමාට නොහැකි වීම මහා අභාග්‍යයක් නොවේ ද? සියල්ල විසඳන්නට කාලයට ඉඩ දී බලා සිටින්නේ කෙසේ ද? එසේ සිටිය යුතු ද? එසේ සිටිය හැකි ද?

අනුරාධ ඇඳෙන් නැගිට විත් නැවත වතාවක් දුරකතනය අතට ගත්තේ ය. නිෂාධිගේ අංකය එබූ ඔහු නොඉවසිල්ලෙන් ඇහුම් කන් දුන්නේ ය. අනෙක් කෙළවරේ දුරකතනය නාද වන හඬ පමණක් ඔහු බොහෝ වේලාවක් අසා සිටියේ ය.

නිෂාධි.... ඇයට කරදරයක් ද?

0000000000000

දිලීප නිවසට ආවේ බොහෝ රෑ බෝ වූ පසුව ය. ගෙට ගොඩ වන්නට යන මොහොතේ ඔහු වැටෙන්නට ගියේ ය. නොවැටී බේරුණේ උලුවස්ස අල්ලා ගැනීම නිසා ය. ඔහු බීමත්ව සිටිතැයි කෑම මේසය අසළ වාඩි වී සිටි නිෂාධි සිතුවා ය.

දොර රාමුව යටට වී නිෂාධි දෙස බලා සිටි දිලීප සීරුවෙන් අඩි තබමින් ඈ වෙත ආවේ ය. මේසයේ අනෙක් කෙළවරේ ඇයට මුහුණ ලා වාඩි වූ ඔහු සිය අතෙහි වූ පාර්සලය මේසය හරහා ඇය වෙත තල්ලු කර දැමුවේ ය. එයින් එළියට විසිවුණු රතු මිදි ගෙඩි කීපයක් මේසය මත පෙරළී ගොස් බිමට වැටෙණු නිෂාධි හැඟීම් විරහිතව බලා සිටියා ය.
''ක... කන්න..'' ඔහු ආයාසයෙන් කීවේ ය. ''ඔයා මිදි ක...න්....න ආසයිනෙ..''

ඇය යමක් කියතැයි ඔහු මොහොතක් බලා සිටියේ ය.
''ත ..ර .. හ.. ද..? පොඩි ඩ්‍රින්ක් එකක් ගත්තා.. ගත්තා නෙවෙයි ගන්න වුණා.. අද ෆ්‍රයිඩෙනේ.. සො.. රි..'' ඔහු පුටුවෙන් නැගිටිමින් කීවේ ය. ඈ පළමු වරට ඔහුගේ මුහුණ දෙස බැලුවා ය. ඔහුගේ දෑස් තුළ කැටි වුණ වේදනාව ඇය වහා හඳුණා ගත්තා ය. වසංගන්නට ඔහුට ඉඩක් නැති ලෙස ඒ වේදනාව ඔහුගේ දෑස් තුළ අපූරුවට පැලපදියම්ව තිබුණි. සිනාවක් හෝ තේතමනයක් හෝ නැති ඇගේ බැල්ම ඔහු අපහසුවට පත් කළේ ය. ඇගේ දෑස දෙස එක එල්ලේ බලා සිටිය නොහැකිව ඔහු ඉවත බලා ගත්තේ ය.

මොන මොනවාදෝ තමාටම මුමුණා ගනිමින් ඔහු ඈ වෙතින් ඈතට ගියේ ය. ඔහු පිළිබඳ උපන් කණගාටුවක් ඇගේ සිතේ කොණක මතු වී වද දුන්නේ ය. යෝධයකු සේ දැඩිව සිටි දිලීප වැහැරෙමින් සිටින්නේ ය යන සිතිවිල්ල ඇගේ සිතට වහා ඇතුල් විය. එය කණගාටුවකි.

ඔහු හැර යන්නට සිදුව ඇති බව ඇත්ත ය. එහෙත් ඒ හැර යාම තුළ ඔහු ගේ පිරිහීමක් දකින්නට ඇය කිසි ලෙසකින් වත් අපේක්ෂා නොකළා ය. ඔහු යෝධයකු සේ ජීවත් වූ අයුරින්ම මේ සියල්ල ශක්තිමත් ව විඳ දරා ගනු ඇතැයි ඈ අපේක්ෂා කළා ය. මේ තාක් කාලයක් ඔහු කළේ රඟ පෑමක් ද? ඔහුගේ දැඩි බව රඟපෑමක් පමණක් ද? ඔහු වෙතින් මෙවන් කඩා වැටීමක් දකින්නට දැන් හැකිව ඇත්තේ එනිසා නොවේ ද?

නිෂාධි මේසය මත වූ කඩදාසි බෑගයෙන් මිදි ගෙඩියක් අතට ගත්තා ය.
ඇයට සුසුමක් හෙලුණි. බොහෝ කලකට පසුව දිලීප වෙනුවෙන් සිය සිතෙහි කණගාටුවක් ජනිතව ඇති බව දැනෙත් ම ඇය සසළ වූවා ය. දැන් හැඟීම් වලට ඉඩ දෙන්නට හැකියාවක් නැති බව ඇය දනියි. දැන් සියල්ලටම ප්‍රමාද වැඩි ය. කිසිදු සිතුවිල්ලකට හැරවිය නොහැකි තරමට සියල්ල වෙනස් වී ඇත. ඒ වෙනුවෙන් වෙහෙසීම ඒ වෙනුවෙන් තැවීම නිෂ්ඵල ව්‍යායාමයක් පමණකි.

අතට ගත් මිදි ගෙඩිය ආපසු බෑගයටම දැමූ නිෂාධි මේසයෙන් නැගිට්ටා ය.

නිදන කාමරය දෙසින් දිලීප ගොරවන හඬ ඇසෙයි. ඈ ඔහු දෙස නොබලාම තමාගේ කාමරයට ඇතුල් වී දොර වසා ගත්තා ය.